පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

සතිය - 28

විෂය - නර්තනය

ශ්‍රේණිය - 13

Prepared by – M.B.I.G. Kumari
R/Sumana Balika Vidyalaya

නිපුණතාව 04 ඃ විවිධ අත්දැකීම් ඇසුරුකර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.
නිපුණතා මට්ටම 4.1ඃ ගොප්කොළ හා රඹ පතුරු ආශ්‍රිත සැරසිලි නිර්මාණය කරයි.
ක්‍රියාකාරකම් 4.1.2 ඃ පහන් පැලක්/මල් පැලක් නිර්මාණය කරමු.

- **නිවැරදි පිළිතුරු තෝරන්න.**

1. පහන් පැලක් නිර්මාණය කිරීමට,

(i). අඩි 8ක් පමණ උස ඉනි තුනක් අවශ්‍ය වේ.
(ii) අඩි 10ක් පමණ උස ඉනි හතරක් අවශ්‍ය වේ.
(iii). අඩි 8ක් පමණ උස ඉනි හතරක් අවශ්‍ය වේ.
(iv). අඩි 5ක් පමණ උස ඉනි දෙකක් අවශ්‍ය වේ.

2. පහන් පැල නිර්මාණයේ දී වෘත්තාකාරව බැඳ ගන්නා ගොප් අතු අග කෙළවර එකට අල්ලා බඳිනු ලැබේ. මෙය,

(i). ගොප් කුරිය නමින් හඳුන්වයි. (ii). ගොප් ගෙත්තම නමින් හඳුන්වයි.
(iii) පොල් පන්දම නමින් හඳුන්වයි. (iv). අත් පන්දම නමින් හඳුන්වයි.

3. පහන් පැලක් නිර්මාණයේ දී යොදා ගනු ලබන අමුද්‍රව්‍ය දෙකකි,

(i). ක්‍රෝටන් කොළ හා ගොප් කොළ (ii). ගොප් අතු හා ඉරටු
(iii). හබරල අතු හා ඉරටු (iv). ගොප් අතු හා කොළ

4. පහන් පැල ......... නමින් ද හඳුන්වයි.,

(i). පිදේණිය (ii). යහන (iii). කත්තිරික්කය (iv). මල් පැල

5. පහන් පැල නිර්මාණයේ දී යොදා ගනු ලබන ගොප් අත්ත ගෙත්තම් කර ගනු ලබන්නේ,

(i). පොල් අතු විවීමේ රටාවෙනි (ii). පන් පැදුරු විවීමේ රටාවෙනි
(iii). පොල් කොළ පැදුරු විවීමේ රටාවෙනි (iv). අත්කම් නිර්මාණ සකස් කර ගන්නා ආකාරයෙනි.

- **හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු යොදන්න .**

6. පහන් පැල නිර්මාණයේ දී කුඩුව ඇතුළත ...........................................................................කැබැල්ලක් එලා ඒ මත මල් පහන් දල්වීම කරනු ලබයි.

7. ගෘහීය අවශ්‍යතාවයක් ලෙස පහන් පැල යොදා ගන්නා අවස්ථාවකි.............................................................................

8. දේව ශාන්ති කර්මවලදී මල් පැල යොදා ගන්නා අවස්ථාවකි.............................................................................

9. යක් ශාන්ති කර්මවල දී මල් පැල යොදා ගන්නා අවස්ථාවකි.............................................................................

10. ග්‍රහ ශාන්ති කර්මවල දී මල් පැල යොදා ගන්නා අවස්ථාවකි.............................................................................

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

11. ගොප්කොළ භාවිතයෙන් සැරසිලි කළ හැකි අවස්ථා තුනක් ලියන්න.
12. පහන් පැලක් සකස් කිරීමට අවශ්‍යය අමුද්‍රව්‍ය ලියන්න.
13. එය සකස් කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න.
14. දේශීය ශාන්තිකර්මයන්හී දී සැරසිල්ලක් ලෙස පහන් පැල භාවිතයට ගන්නා අවස්ථා පිළිබඳ විමසීමක් කරන්න.